# NDB සහ CRISIL ශ්‍රී ලංකාවේ එකම ස්ථාවර ආදායම් දර්ශක එකතුව හඳුන්වාදෙයි

2012 දෙසැම්බර් 04, අඟහරුවාදා - ශ්‍රී ලාංකික ප්‍රාග්ධන වෙළෙඳපොළේ වැදගත් මං සලකුණක් සනිටුහන් කරමින්, NDB Capital Holdings PLC විසින් මෙරට එකම ස්ථාවර ආදායම් දර්ශක එකතුව හඳුන්වාදීමට සැලසුම් කර ඇත. 2012 දෙසැම්බර් 05 වැනිදා හඳුන්වා දෙනු ලබන මෙම දර්ශක එකතුව ස්ථාවර ආදායම් දර්ශක හතරකින් සමන්විත වේ. රජයේ සුරැකුම්පත් වල කාර්යසාධනය මැන බලන මෙම දර්ශක හතර එළිදක්වනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසිනි.

මෙම ස්ථාවර ආදායම් දර්ශක නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාම සිදුකරනු ලබන්නේ ප්‍රධාන පෙළේ ඉන්දියානු ආයතනයක් වන CRISIL සමාගම විසින් වන අතර එම සමාගම මගින් ඇගයීම්, සමීක්ෂණ, අවදානම් සහ ප්‍රතිපත්ති සම්පාදන සේවාවන්ද සපයනු ලබයි. මේ මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිකයන්ට වඩාත් පැහැදිලි බවක් ලැබෙන අතර රජයේ සුරැකුම්පත් වඩාත් හොඳ ආයෝජනයක් ලෙස ප්‍රචලිත කරගැනීමටද කරගැනීමටද අවස්ථාව හිමිවේ.

NDB Capital Holdings PLC සමූහයේ පූර්ණ හිමිකාරීත්වය යටතේ පවතින මෙරට ප්‍රමුඛතම ආයෝජන බැංකුවක් වන NDB Investment Bank සහ CRISIL සමාගම මෙම දර්ශකයන් පවත්වා ගෙන යනු ලැබේ. මෙම දර්ශකයන් හතර නිර්මාණය කර ඇත්තේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර යන අංශයන් ආවරණය වන පරිදිය. NDBIB-CRISIL දින 91 භාණ්ඩාගාර බිල් පත් දර්ශකය, NDBIB-CRISIL දින 364 භාණ්ඩාගාර බිල් පත් දර්ශකය, NDBIB-CRISIL අවුරුදු 3 භාණ්ඩාගාර බැඳුම්කර දර්ශකය සහ NDBIB-CRISIL අවුරුදු 5 භාණ්ඩාගාර බැඳුම්කර දර්ශකය මීට අයත් වේ.

මෙහිදී අදහස් දැක්වූ ජාතික සංවර්ධන බැංකුවේ (NDB) සභාපති හේමක අමරසූරිය මහතා “මෙවන් හඳුන්වාදීමක් කරන්නට හැකිවීම අපට විශාල සතුටක්. රජය 2013 අයවැය යෝජනා මගින් මෙරට ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි සංවර්ධනය වෙනුවෙන් පියවර රැසක් ගෙන තිබෙනවා. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කෙරෙහි මෙම දර්ශකයන් උත්ප්‍රේරකයක් වන බව අපි විශ්වාස කරනවා. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ අවධානය මේ වෙත යොමු වෙනු ඇතැයිද අපි බලාපොරොත්තු වෙනවා.” යනුවෙන් පවසා සිටියේය.

මේ අවස්ථාවේදී තම අදහස් දක්වා සිටි CRISIL Research ප්‍රධානී මුකේෂ් අගර්වාල් මහතා “ඉන්දියානු ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි දර්ශකයන් බොහෝ ප්‍රමාණයක ප්‍රමුඛ නිර්මාණකරු CRISIL සමාගමයි. ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර සුරැකුම්පත් වෙළෙඳපොළේ දියුණුවට මෙයින් විශාල පිටිවහලක් ලබා ගත හැක. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන්නන් හට අවදානම් ප්‍රතිලක්ෂණ පිළිබඳව විශ්වාසනීය

සහ ස්වාධීන මිණුම් ක්‍රමවේදයක් මෙයින් ලබාදෙනවා. වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය වඩාත් පහසු කිරීම සඳහා අප විසින් සිදුකරන ලද තවත් එක් මෙහෙවරක් වශයෙන් මෙය හඳුන්වන්නට කැමතියි" යනුවෙන් පවසා සිටියේය.

මෙම කර්තව්‍යයට පුරෝගාමී නායකත්වයක් ලබා දෙන NDB Capital Holdings PLC හි ප්‍රධාන විධායක නිලධාරි වජිර කුලතිලක මහතා "හොඳින් කටයුතු සිදුවන වෙළෙඳපොළක දර්ශකයක් යනු අත්‍යවශ්‍ය මූලිකාංගයක්. මෙම දර්ශකයන් සඳහා අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙමින් ආයෝජකයන්ට, විශ්ලේෂකයන්ට හා ආර්ථික විශේෂඥයන්ට උපකාරී වන මෙම දර්ශක හඳුන්වා දෙන්නට හැකිවීම ප්‍රාග්ධන වෙළෙඳපොළේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක් ඉටුකිරීමක් ලෙස හඳුන්වන්නට පුළුවන්." යනුවෙන් පවසා සිටි යේය.

අවධානම් රහිත සුරැකුම්පත් වල ක්‍රියාකාරීත්වය දැක්වීමට අමතරව මෙම දර්ශකය මගින් ස්ථාවර ආදායම් පෙළගැස්ම සහිත අරමුදල් වල ක්‍රියාකාරීත්වය මැනීමටද වැද දායකත්වය දක්වනු ඇත. මෙම දර්ශක මගින් මෙරට රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළේ සමස්ත ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කල හැකි අතර රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළට ප්‍රයෝජනවත් මූල්‍ය දර්ශක පථ හඳුන්වාදීමද මෙමගින් සිදුකළ හැක. එසේම ඒවාට බැඳී ඇති ව්‍යුත්පන්නයන් ගොඩනැංවීමටද දර්ශකයන් විසින් හැකියාව ලබා දෙයි. මෙම දර්ශක දේශීය වෙළෙඳපොළට සරිලන ආකාරයෙන් ගොඩනැංවීම සඳහා NDB සහ CRISIL ආයතන විසින් බැංකු, මුල් ගැනුම්කරුවන්, නියාමකයන්, මූල්‍ය තැරැව්කරුවන් සහ මූල්‍ය කළමනාකරුවන් වෙළෙඳපොළ ක්‍රියාකාරීන්ගෙන් අදහස් හා උපදේශනය ලබාගැනීම සිදු කෙරිණි.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ මේ වන විට ශ්‍රී ලංකාවේ ස්ථාවර ආදායම් සුරැකුම් සඳහා විශාලතම සහ වඩාත් ද්‍රවශීලීතාවය සහිත වෙළෙඳපොළ බවට පත්ව ඇති අතර එහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 3.2 වේ. බැංකු, රක්ෂණ සමාගම්, අරමුදල් සහ පෞද්ගලික ආයෝජකයන් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළට අවතීර්ණවී සිටිති. රජය විදේශීය ආයෝජකයන්ට අවස්ථාව දීමත් සමග භාණ්ඩාගාර සුරැකුම්පත් සඳහා විදේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය සැලකිය යුතු මට්ටමින් වර්ධනයක් පෙන්නුම් කරන අතර එනිසා රජයේ සුරැකුම්පත් ක්‍රියාවලිය සඳහා ගුණාත්මක මිනුමක් අවශ්‍යවී තිබේ.

**වැඩි විස්තර සඳහා අමතන්න:**

**අනිෂ්කා රණබාහු - 073088705**

***Ogilvy PR Worldwide, Sri Lanka.***

**CRISIL සමාගම**

CRISIL යනු ජාත්‍යන්තර විශ්ලේෂක සමාගමක් වන අතර ඇගයීම්, සමීක්ෂණ සහ අවදානම් සහ ප්‍රතිපත්ති උපදේශන සේවා සැපයීම සිදුකරයි. එය ඉන්දියාවේ ප්‍රධානතම ඇගයීම් නියෝජිත ආයතනය වේ. ලොව ප්‍රමුඛතම බැංකු සහ ව්‍යාපාරික ආයතන වෙත උසස් සමීක්ෂණ සේවා ලබා දීමද CRISIL විසින් සිදුකරනු ලැබේ.

## CRISIL සමීක්ෂණ ආයතනය

CRISIL යනු ඉන්දියාවේ විශාලතම ස්වාධීන සහ ඒකාබද්ධ සමීක්ෂණ ආයතනයයි. ඉන්දීය ආර්ථිකය, කර්මාන්ත, ප්‍රාග්ධන වෙළෙඳපොළවල් සහ සමාගම් සම්බන්ධයෙන් උපදේශනයන් සහ විශ්ලේෂණයන් ලබා දීම CRISIL සමීක්ෂණ ආයතනය විසින් සිදුකරයි. එය ඉන්දියාවේ ආර්ථික සහ කර්මාන්ත සම්බන්ධයෙන් වඩාත් විශ්වසනීයම සමීක්ෂණ ආයතනය වශයෙන්ද හැඳින්විය හැකිවේ. ක්ෂේත්‍රයන් 70කට අධික ප්‍රමාණයක කර්මාන්ත CRISIL සමීක්ෂණ මගින් ආවරණය කරයි. 4,500කට වැඩි සේවක පිරිසකගෙන් සමන්විත ජාලයේ කර්මාන්ත විශේෂඥයන්, කර්මාන්ත සංගම් සහ වෙළෙඳ බෙදාහැරීම් අංශයේ පිරිස් සේවයෙහි නිරත වෙති. ඉන්දීය ස්ථාවර ආදායම් වෙළෙඳපොළවල්හි ප්‍රමුඛ ස්ථානයක් CRISIL වෙත හිමිව තිබේ. ඉන්දියාවේ ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්ෂේත්‍රයේ විශාලතම තක්සේරුකරුවා වන CRISIL පොදු අරමුදල් සම්පාදනය, රක්ෂණ හා බැංකු කර්මාන්ත ක්ෂේත්‍රයන්හිද කටයුතු කරයි. CRISIL ඉන්දියාවේ පොදු අරමුදල් හා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයන්හි ණය සහ මිශ්‍ර දර්ශක සඳහා එකම සැපයුම්කරු ද වේ. එසේම CRISIL වර්තමානයේ ඉන්දියාවේ ප්‍රමුඛතම මෙන්ම විශාලතම ස්වාධීන සම කොටස් සමීක්ෂණ ආයතනයද වේ. තොරතුරු සහ දත්ත විශේෂඥ විනිශ්චයන්ට පරිවර්ථනය කිරීම හා අනාවැකි පල කිරීම සම්බන්ධයෙන්ද ඔවුන් සුවිශේෂ කාර්යභාරයක් ඉටුකරයි. ක්ෂුද්‍ර හා මහාපරිමාණ ව්‍යාපාරික බැඳීම් සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් සහිතව විශාල ක්ෂේත්‍ර ආවරණයක් ලබා දෙන්නට CRISIL සමීක්ෂණ ආයතනයට හැකියාව තිබේ. එසේම CRISIL අන්තර්ජාලය මූලික කරගනිමින් නව්‍ය සමීක්ෂණ ක්‍රමවේදයක් ලබා දෙන අතර ආර්ථික විශේෂඥයන්, ක්ෂේත්‍ර විශේෂඥයන්, සමාගම් සමීක්ෂකයන් හා තොරතුරු කළමනාකරණ විශේෂඥයන්ගෙන් සමන්විත වේ.

## NDB Capital Holdings PLC (NCAP)

NDB Capital Holdings PLC යනු NDB සමූහයේ ආයෝජන බැංකුකරණ අංශය භාරව කටයුතු කරන සමාගමයි. ගාස්තු මූලික හා අරමුදල් මූලික ආයෝජන බැංකුකරණය, කොටස් වෙළෙඳපොළ තැරැව්කාර සේවා, මූල්‍ය කළමනාකරණය සහ පුද්ගලික සමකොටස් ආයෝජන යන ව්‍යාපාර අංශයන්හි නියුතු එකම ලැයිස්තුගත පූර්ණ සේවා ආයෝජන බැංකුව වේ. තම උප ආයතන හා ව්‍යාපාරික සහයෝගිතාවයන් හරහා පාරිභෝගිකයන්ට ආයෝජන බැංකුකරණ අංශයේ විශාල සේවාවක් ලබාදීමට NCAP සමත්ව සිටී.

## NDB ආයෝජන බැංකු සමාගම (NDBIB)

NCAP හි ආයෝජන බැංකුකරණ අංශය වන NDBIB, ණය සහ සමකොටස් සහ බෙදාහැරීම්, ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකිරීම්, ඒකාබද්ධකිරීම් හා ප්‍රතිග්‍රහණයන්, මූලික මහජන නිකුතුන්, පුද්ගල ස්ථාපනයන් සහ යටි තල පහසුකම් සංවර්ධනයන් යන අංශයන්හි උපදේශන සේවාවන් ලබා දෙයි. NDB සමූහයේ සහක්‍රියාකාරීත්වය මත කලාපීය සහයෝගිතාවයන් සහ දේශීය සහ විදේශීය වාණිජ බැංකු සමග ගොඩනගා ගෙන ඇති ශක්තිමත් සබඳතා, ඒකක භාරයන් සහ විශ්‍රාම සහ පාරිතෝෂික අරමුදල් යන ක්ෂේත්‍රයන්හි NDBIB කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ හොඳම ආයෝජන බැංකුව වශයෙන් තම ස්ථාවරය දිගටම පවත්වාගෙන යන NDBIB, Euromoney සඟරාව විසින් පවත්වන විශිෂ්ටතා සම්මාන උළෙලෙහිදී 2012 වසරේ මෙරට හොඳම ආයෝජන බැංකුව වශයෙන්ද සම්මානයට පාත්‍රවී තිබේ.